2023 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ආයතනයේ නම: ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය: 309

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය 2

1.1 හැඳින්වීම 2

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 6

1.3 ප්‍රධාන කාර්යයන් 10

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ..... 11

1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන /අරමුදල්..... 12

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම..... 13

2.1 2023 දක්වා අතීත කාර්ය සාධනය 12

2.2 2023 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය..... 15

2.3 උපදේශක අංශයේ කාර්ය සාධනය 17

2.4 සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම..... 18

පරිච්ඡේදය 03-2023 දෙසැම්බර් 31දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය 19

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.....19

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය.....20

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය.....21

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්..... ...22

1.වාර්තාකරණ කාල පරිච්ඡේදය... 22
2.මිනුම්කරණ පදනම..... ..22
3.ආදායම් හඳුනා ගැනීම..... .22
4.දේපළ, පිරියත හා උපකරණ හඳුනා ගැනීම හා මැනීම 22
5.දේපළ, පිරියත හා උපකරණ සංචිතය..... .22
6.මුදල් හා මුදල් සමාන දෑ.....22

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 23

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය.....23

3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත්අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන.....24

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය..... 25

3.8 විගණකාධිපතිවරයාගේ වාර්තාව** 27

පරිච්ඡේදය 04— කාර්ය සාධන දර්ශක 40

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG)සපුරා ගැනීමේ කාර්ය සාධනය 41

පරිච්ඡේදය 06- මානව සම්පත් පැතිකඩ 42

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 42

6.2 **ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න..... 43

6.3 මානව සම්පත් කළමනාකරණය 44

පරිච්ඡේදය 07— අනුකූලතා වාර්තාව.....46

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම


රාජ්‍ය වැඩ දෙපාර්තමේන්තුව (PWD) යටතේ ක්‍රියාත්මක වූ ගොඩනැගිලි දෙපාර්තමේන්තුව 1969 දී ස්ථාපිත කරන ලද අතර දශක 5 කට වැඩි කාලයක් පුරා ගොඩනැගිලි සහ යටිතල පහසුකම් සංවර්ධනය සඳහා වගකියනු ලබන ස්වාධීන ආයතනයක් ලෙස ක්‍රියාත්මක වේ. මෙම දෙපාර්තමේන්තුව ගොඩනැගිලි සහ ඒ ආශ්‍රිත යටිතල පහසුකම් කටයුතු ක්ෂේත්‍රය තුළ පූර්ණ අධිකාරිය ඇති උපදේශක ආයතනය වෙයි. ගොඩනැගීම් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී සහ එම වැඩසටහන් සම්බන්ධ නීතිමය ක්‍රියාමාර්ගයන් සම්බන්ධව කටයුතු කිරීමේදී විශේෂඥ උපදෙස් ගැනීම පිණිස ද එය කැඳවීම කරනු ලබයි.

දෙපාර්තමේන්තුවේ ක්‍රියාකාරිත්වය, මූල්‍ය රෙගුලාසි, භාණ්ඩාගාර චක්‍රලේඛ සහ ගැසට් නිවේදනය තුළ දක්වා ඇත. ජාතික සංවර්ධනය තුළ සහ රාජ්‍ය ගොඩනැගිලි වත්කම් සංරක්ෂණයේදී දෙපාර්තමේන්තුව අනගිභවනීය කාර්ය භාරයක් ඉටු කරනු ලබයි

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වෙනි සංශෝධනයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ප්‍රතිව්‍යුහගත කෙරිණි .ශ්‍රී ලංකාවේ රජයේ ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීමේ වගකීම සම්බන්ධව අධිකාරිය සහ වගකීම ඇත්තේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවටයි. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යෙදවීම තුළින් දෙපාර්තමේන්තුව තම වගකීම ප්‍රති අර්ථකතනය කරයි.

සංස්ථානික තොරතුරු


නම	-	ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
නෛතික තත්ත්වය	-	පූර්ණ රාජ්‍ය ආයතනයකි
අමාත්‍යාංශය	-	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	-	දෙවන මහල “සෙත්සිරිපාය”, බත්තරමුල්ල ශ්‍රී ලංකාව දුර. 94 11 2862588 ෆැක්ස්. 94 11 2864771 විද්‍යුත් තැපෑල info@buildingsdept.gov.lk අන්තර්ජාල ලිපිනය www.buildings.gov.lk



රූපය 1: ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ පිහිටීම

කලාප කාර්යාල

කලාප කාර්යාලය	ලිපිනය
කලාප 1 (බස්නාහිර උතුර)	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො. 213, ටොරින්ටන් පෙදෙස, කොළඹ 07
කලාප 1 (බස්නාහිර දකුණ)	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 1) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො. 213, ටොරින්ටන් පෙදෙස, කොළඹ 07
කලාප 2	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 2) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, වෙරළ පාර, ගුරුනගර්, යාපනය
කලාප 3	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 3) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, විල්ගොඩ පාර, කුරුණෑගල
කලාප 4	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 4) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - මන්මුනෙ උතුර, මඩකලපුව
කලාප 5	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 5) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, තැපැල් පෙට්ටිය 113, මහනුවර
කලාප 6	ප්‍රධාන ඉංජිනේරු කාර්යාලය (කලාප 6) , ගොඩනැගිලි දෙපාර්තමේන්තුව, නො.10, ඉහල ඩික්සන් මාවත, ගාල්ල.



රූපය2: කලාප බෙදීමේ සිතියම

විධායක සාරාංශය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාව තුළ රජයේ ගොඩනැගිලිවල සැලසුම් සහ ඉදිකිරීම් සම්බන්ධව වගකියන ප්‍රමුඛ රජයේ ආයතනය ලෙස දශක 5කට වැඩි කාලයක් කටයුතු කරමින් සිටී. මේ වන විට, වෙනස් වෙන ආර්ථිකයට සහ තාක්ෂණයට ගැලපෙන ලෙස සංවර්ධනය කර ඇති රජයේ දෙපාර්තමේන්තු අතුරින් එකක් වීමට අප ආයතනය සමත් වී ඇත. ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික සේවා වෙත විශේෂ අවධානයක් යොදවමින් දෙපාර්තමේන්තුව තම වගකීම සහ මෙහෙවර ප්‍රකාශය අර්ථ කථනය කරගෙන යනු ඇත.

මෙම කාර්ය සාධන වාර්තාව සකසා ඇත්තේ වැඩි දියුණු වූ කාර්ය සාධනය සඳහා ඉලක්ක සැකසීම, ශ්‍රම බලකාය අධීක්ෂණය, පාලනය සහ සමාලෝචනය, අනුකූලතාව ප්‍රදර්ශනය කිරීම, බාහිර වාර්තා සැකසීම , කාර්ය සාධනය වැඩි දියුණු කිරීම සහ ඉංජිනේරුවරුන්, සේවාදායකයන් සහ කොන්ත්‍රාත්කරුවන් අතර සන්නිවේදනය වැඩිදියුණු කිරීම යන අරමුණු සහිතවය.

අතීත කාර්ය සාධනය හා සාපේක්ෂව ගත් විට මෙම වසරේ කාර්ය සාධනය ඇගයිය යුතු මට්ටමක පවතී. කලාප 7 තුළම ක්‍රියාත්මක කෙරෙන ව්‍යාපෘති සාරාංශගත කර ඇත. පුනරාවර්තන වියදම් වල සහ ප්‍රාග්ධන වියදම් වල සාරාංශය මඟින් පෙන්වන පරිදි අනෙකුත් සමාන ආයතනවලට සාපේක්ෂව, නිමැවුම් පිරිවැය ඵලදායී වන අතර කාර්යක්ෂමද වේ.

වාර්ෂික ක්‍රියාකාරී වැඩසටහනේ කාර්ය සාධනය එහි ඉලක්කයට සාපේක්ෂව ගත්විට ගිවිසුම් කාලය තුළ ඉලක්කයට ළඟා වී ඇති අතර කාර්ය සාධනය සහ වැඩ ගුණාත්මක බව වැඩි කිරීමට සමාලෝචනයද සිදු කරයි. විවිධ වෘත්තිකයන්ගෙන් සමන්විත දෙපාර්තමේන්තුවේ කාර්යමණ්ඩලය, ලැබී ඇති සම්පත් ප්‍රශස්ත ලෙස භාවිතා කරමින් ඉහළ සේවාවන් ලබා දෙයි. උපරිම කාර්යක්ෂමතාවයක් තුලින් දෙපාර්තමේන්තුවේ ඉලක්ක ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය සේවක සංඛ්‍යාවේ පුරප්පාඩු පිරවීමට දෙපාර්තමේන්තුව උත්සහ දරයි. විවිධ බාහිර සහ අභ්‍යන්තර පුහුණු වැඩසටහන් පවත්වමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ දැනුම වර්ධනය කර ගෙන යනු ලබයි. වාර්ෂික විගණන සැලසුම අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් පරිපාලනය, මූල්‍ය සහ වෙනත් කටයුතු විගණනය සිදු කරනු ලැබේ.

වර්තමාන අවශ්‍යතාවයන් සම්බන්ධව කටයුතු කිරීම පිණිස දෙපාර්තමේන්තුවේ කාර්ය භාරයන් නැවත සකස් කිරීමට ගොඩනැගිලි දෙපාර්තමේන්තුව පිළිබඳව අධ්‍යයනයක් අවශ්‍ය වූ අතර අනාගතයේදී රජයට සම්බන්ධ ගොඩනැගිලි ඉදිකිරීම්, නඩත්තු කිරීම්වලට අදාල සියලු ව්‍යාපෘති භාර ගැනීමේ ඉලක්කය සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කරමින් සිටී.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ජනතාවට විශිෂ්ඨ සේවාවක් ලබාදීම පිණිස සුරක්ෂිත වූද, පිරිමැසුම් දායක වූද , තිරසාර හා විශිෂ්ඨ ලෙස නිමවූ ගොඩනැගිලි පරිසරයක් රාජ්‍ය අංශ ආයතන වලට ලබා දෙමින් ගොඩනැගිලි තාක්ෂණයේ පුමුඛයා බවට පත් වීම.

මෙහෙවර

තාක්ෂණික වගකීම අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව , පිරිමැසුම්දායක බව, ගුණාත්මක භාවය, සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි එසේම තත් කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික, නඩත්තු කිරීම්, උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවක් සැපයීම.

අරමුණු

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රාජ්‍ය අංශයේ ගොඩනැගිලි වැඩිදියුණු කිරීම සඳහා විශිෂ්ඨ සේවයක් සැපයීමට වගකිව යුතු මූලික රාජ්‍ය ආයතනය ලෙස;

- සේවාදායක අවශ්‍යතාවය සපුරමින් ඔවුන් තෘප්තිමත් කිරීම.
- ව්‍යවස්ථාපිත නියාමන අවශ්‍යතාවයන් සහ අදාල සම්මතයන්ට අනුගත වීම.
- පසුවිපරම් කිරීම ප්‍රතිපෝෂණයන් හා දැනුම් හැකියාව යාවත්කාලීන කිරීම තුලින් අපගේ සේවා සැපයීම වැඩිදියුණු කිරීමෙහිලා නිරන්තර යොමු කිරීම.
- විවිධ ක්ෂේත්‍රයන්ට අයත් වෘත්තිකයන්ගේ ගැලපීම තුලින් සම්පූර්ණ දායකත්වය ලබාදීම.

දෙපාර්තමේන්තුවේ සහතිකය

සේවාදායකයාගේ තාක්ෂණික සහ කළමනාකරණ ධාරිතාව සලකා බලමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සක්‍රිය සහයක් ලබාදෙනු ලැබේ. ඉදිකිරීම් සඳහා සහතිකයක් ලබාදීමට ඇති අවශ්‍යතාවය අපි අගය කරන අතර පහත ක්‍රියාමාර්ග තුළින් අවදානම අඩු කරගැනීමට වගකියන්නෙමු:

1. යාවජීව තාක්ෂණික/මූල්‍ය වගවීම
2. සම්පූර්ණ ගොඩනැගිල්ල සඳහා බලයලත් ඉහළම වෘත්තිකයන් වෙතින් සැලසුම්
3. සියලුම රීති රෙගුලාසි සහ තත්ත්ව හා ආරක්ෂක ප්‍රමිතීන් අනුගමනය කිරීම
4. අතීත අත්දැකීම් භාවිතා කරමින් විශේෂයෙන් සංවර්ධනය කළ අති නිරවද්‍ය විෂය පථය
5. අනෙකුත් සේවා සපයන්නන්ගෙන් සැලසුම්, ලේඛන යනාදිය පරීක්ෂා කර තත්ත්වය සහ ආරක්ෂාව තහවුරු කිරීම
6. කොන්ත්‍රාත් කළමනාකරණය කිරීම
7. අත්දැකීම්ලත් වෘත්තීය ව්‍යාපෘති කළමනාකරණ සේවය මඟින් වටිනාකම් සහතික කර දීම
8. කළමනාකරණ විගණනවල මතුවන ගැටළුවලදී සහය ලබාදීම
9. ගිවිසුම්ගත නීතිමය කටයුතුවලදී සහය ලබාදීම
10. තාක්ෂණික ඇගයීම් සහ ප්‍රසම්පාදන කමිටුවලට සහභාගි වී තාක්ෂණික සහය ලබාදීම
11. ඉදිකිරීම් සහ අලුත්වැඩියාවන් සඳහා ගොඩනැගිලි සඳහා මිල ගණන් සාරාංශ (*BSR)* සකස් කිරීම හා ප්‍රකාශයට පත් කිරීම

කළමනාකාරීත්ව-ධුරාවලිය

ඉංජි.කේ.ජී.සන්ධ්‍යා කුමුදිනී මහත්මිය	අධ්‍යක්ෂ ජනරාල්
ඉංජි.ජී.එච්.හිරිමුතුගොඩ මහත්මිය	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ඉංජිනේරු සේවා)
වාස්තු විද්‍යාඥ කේ.බී. මේනක මංගලනාථ මහතා	අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (උපදේශන සේවා)
ඉංජි .ඒ.එම්. වික්‍රමසිංහ මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 1)
ඉංජි ජී.ආර්.එස්.බී.ගම්ලත් මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 2)
ඉංජි.එස්.එස්.රන්වත්ත මහතා	අධ්‍යක්ෂ (ඉදිකිරීම් - කලාප 3)
ඉංජි.එච්.එම්.ආර්.බණ්ඩාර මහතා	අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන හා තාක්ෂණ සංවර්ධන)
ඉංජි.ජී.එච්.ඒ.බී.සජෝත මහතා	අධ්‍යක්ෂ (ඉංජිනේරු නිර්මාණ)
ඉංජි .ඊ.ඩී.එම්.එස්.ගුණරත්න මහත්මිය	අධ්‍යක්ෂ (විදුලි හා යාන්ත්‍රික)
එස්.ඩී.ඩී.පී. සිංහපුර මහත්මිය	අධ්‍යක්ෂ (පාලන)
ජී.වී.ඒ.සජීවනී මහත්මිය	ප්‍රධාන ගණකාධිකාරී
කේ.ජී.බී.ප්‍රියන්ත මහතා	ප්‍රධාන අභ්‍යන්තර විගණක
වාස්තු විද්‍යාඥ ආර්.ඒ.ටී.එස්.රණතුංග මහත්මිය	අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)

සපයන සේවාවන්

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සේවාදායකයන්ට තම අවශ්‍යතාවයන් සපුරා ගැනීමට හා තම ගොඩනැගිලි, යටිතල පහසුකම් සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනීමෙහිලා ඇති වෙන ධාරිතා පරතරය පිරවීමට කටයුතු කරයි.

ව්‍යාපෘති යෝජනා (මෙහි කාර්යය වන්නේ සේවාදායකයා හඳුනා ගත් ව්‍යාපෘති සඳහා පහසුකම් සැපයීමයි)

ව්‍යාපෘති අනුමැතීන් ලබාගැනීමට සහ මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමට සහය වීම පිණිස සේවාදායකයන් සඳහා ව්‍යාපෘති සාරාංශ, ශක්‍යතා වාර්තා, පිරිවැය ඇස්තමේන්තු සහ තාක්ෂණික සහය ලබා දීම අපි සිදු කරන්නෙමු.

කාර්ය නිෂ්ඨාව (ව්‍යවසායක ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

සැලසුම් සැකසීම, සම්පූර්ණ කිරීම සහ ක්‍රියාත්මක කිරීම යන සියල්ල සඳහා අපි සම්පූර්ණ වගකීම භාර ගන්නෙමු. සේවාදායකයාට ඇත්තේ සිදුවිය යුතු සියල්ල සිදුවීමට අවශ්‍ය අනුමැතිය දීම පමණි.

මූල්‍ය රෙගුලාසි වල දක්වා ඇති පරිදි, ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්වරයා නමට නිකුත් කෙරුණු චෙක්පතක් හෝ වැය ශීර්ෂයක් මාරු කිරීමෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අරමුදල් නිකුත් කෙරේ.

උපදේශනය (විධායක කළමනාකරුවෙකුගේ කාර්යය)

අප විසින් පූර්ව කොන්ත්‍රාත් වගකීම ලෙස ශක්‍යතා වාර්තා සැකසීම, සැලසුම් සකස් කිරීම, ප්‍රමාණ පත්‍ර සැකසීම සහ ලංසු ලේඛනකරණය කරනු ලබන අතර පශ්චාත් කොන්ත්‍රාත් වගකීම ලෙස ඉදිකිරීම් කළමනාකරණ සේවාවන් සපයනු ලැබේ. මෙහිදී ලංසු ක්‍රියාවලියේ වගකීම සේවාදායකයා විසින් ගනු ලැබේ.

අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

ව්‍යාපෘති කළමනාකරණය (විධායක/උපදේශන ව්‍යාපෘති කළමනාකරුවෙකුගේ කාර්යය)

උපදේශන හා කොන්ත්‍රාත් ආයතන කලමනාකරණය කිරීමේ වගකීම අප විසින් ගනු ලැබේ. මෙහිදී සේවාදායකයාට උපදෙස් දීම සිදු කෙරේ. රජයේ හෝ පරිත්‍යාගශීලීන්ගේ ආයතන විසින් සිදු කරනු ලබන පුද්ගලික අංශයේ ආයෝජන වැඩසටහන්, BOT, BOOT, සැලසුම් කිරීම හා ඉදිකිරීම් ව්‍යාපෘති අප විසින් භාරගනු ලැබේ. මෙය මඟින් අරමුදල් සේවාදායකයා අත රැඳෙන අතර සේවාදායකයා විසින් ඉදිකිරීම් කටයුතු සඳහා ගෙවීම් කරනු ලැබේ.

නඩත්තුව, විශේෂ අලුත්වැඩියා, වැඩිදියුණු කිරීම් (කාර්යභාරය වනුයේ සේවාදායකයාට පහසුකම් සැපයීමයි)

තත්ත්ව වාර්තා සැකසීම, නඩත්තු කාර්ය සංග්‍රහයන් සැකසීම, නඩත්තු ඇස්තමේන්තු සැකසීම, නඩත්තු ක්‍රියාත්මක කිරීම, ගොඩනැගිලි යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීමට භාරගනු ලැබේ.

සිදු කෙරෙන කටයුතු සඳහා අරමුදල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට නිදහස් කළ යුතුය.

ලබාදෙන වෙනත් සේවාවන්

අනෙක් ආයතනවල ප්‍රසම්පාදන කමිටු, තාක්ෂණික ඇගයීම් කමිටු, ස්ථාවර තාක්ෂණික කමිටු, අනුකමිටු සහ අනෙකුත් අදාල කමිටු සඳහා දක්ෂ තාක්ෂණික නිලධාරීන් සාමාජිකයින් ලෙස පත්කර ඒ සඳහා සහභාගි වෙනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්ගේ ප්‍රකාශය

ජාතික සංවර්ධනයට දායකත්වය

අප දෙපාර්තමේන්තුව ඉදිකිරීම් අංශය තුළින් සම්පූර්ණ වශයෙන්ම රටේ සංවර්ධන කටයුතු වලට දායකත්වය සපයමින් දීප ව්‍යාප්ත ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් ලබාදීමට දෙපාර්තමේන්තුව සමත්විය.

ප්‍රගති සාරාංශය

2023 වසර තුළ ඉලක්කගත අගයට සාපේක්ෂව මූල්‍ය ප්‍රගතියේ ප්‍රතිශතය 86.47% කි.

2023 වසර තුළ මුහුණ දුන් බාධකයන්

- කාර්ය මණ්ඩලයේ හිඟකම
  - ඉංජිනේරුවන්
  - කාර්මික නිලධාරීන් සහ සැලසුම් ශිල්පීන්
  - තාක්ෂණ සහායකයින්
  - රියදුරන්
- පහසුකම් සහ ප්‍රතිලාභ මද හෙයින් රජයේ සේවය තුළ නිලධාරීන් රඳවා ගැනීමේ අපහසුකම, මෑතකදී නිකුත් කල රජයේ නිලධාරීන් සඳහා වන වැටුප් රහිත නිවාඩු චක්‍රලේඛය නිසාවෙන් සේවක සංඛ්‍යාව අඩු වීම.
- වැඩ බිම් වෙත යාම සඳහා වාහන හිඟකම.
- හදිසි ව්‍යාපෘති සඳහා කොන්ත්‍රාත් පදනම මත වැඩබිම් කාර්ය මණ්ඩල ලබා ගැනීමේ අනුමැතිය නොමැති වීම.
- සංචාරක බංගලා නඩත්තුව/ නගාලීම සඳහා ප්‍රමාණවත් ප්‍රතිපාදන නොමැති වීම.
- අත්හිටවූ ව්‍යාපෘති සඳහා කලමනාකරණ ගාස්තු දෙපාර්තමේන්තුව වෙත නොගෙවීම. (සැලසුම් සම්පූර්ණ කිරීමෙන් පසු).
- ඉදිකිරීම් අදියර තුළ සේවාදායකයන් විසින් කරනු ලබන වෙනස් කිරීම් නිසා ව්‍යාපෘති ප්‍රමාද වීම.
- කොන්ත්‍රාත්කරුවන්ගේ සම්පත් මදකම නිසා හා ප්‍රතිපාදන නොමැතිවීම මත කලට වේලාවට ව්‍යාපෘති සම්පූර්ණ කිරීමේ අසීරුතාව.
- සේවාදායකයින් විසින් ව්‍යාපෘති අනුමත කිරීමේ හා පළාත් පාලන අනුමැතීන් ලබාගැනීමේ ප්‍රමාදයන්.

<u>බාධක ජය ගැනීමට යොදන ලද උපක්‍රම</u>

- කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු 135ක් පවතින අතර (පිටු අංක 39) පුරප්පාඩු පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය සඳහා අදාල ආයතන වෙත ඉදිරිපත් කර ඇත.
- පවතින කාර්ය මණ්ඩලයෙන් රාජකාරී ආවරණ හා වැඩ බැලීම් පදනම යටතේ රාජකාරී කටයුතු කරගෙන යාමට පියවර ගෙන ඇත.

ඉංජී.කේ.ජී.එස් කුමුදිනි
ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල්

1.3 ප්‍රධාන කාර්යයන්


ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට මූල්‍ය රෙගුලාසි අංක 787, 788, 789 සහ 790 යටතේ බලතල පැවරී ඇත. ඒ අනුව, තාක්ෂණික නොවන දෙපාර්තමේන්තු සහ වෙනත් ආයතන සඳහා දෙපාර්තමේන්තුව පහත වගකීම් දරයි.


අපගේ බැඳියාවන් සම්භ වඩාත් අනුගත වීම පිණිස දෙපාර්තමේන්තුව අවබෝධතා ගිවිසුමක් මඟින් එකඟතාවයකට පැමිණ සේවාවන් සපයනු ලැබේ.


දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත දැක්වේ.

1. රජයේ දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතන වල වැය ශීර්ෂය තුළ සපයා ඇති මූල්‍ය ප්‍රතිපාදන අනුව ගොඩනැගිලි සැලසුම් කිරීම , ඇස්තමේන්තු සෑදීම, ඉදිකිරීම් සහ අදාල පහසුකම් සැපයීම
2. ගොඩනැගීම් සඳහා උපදේශන සහ ව්‍යාපෘති කළමනාකරණ සේවාවන් සැපයීම.
3. රජයේ ගොඩනැගිලිවල නඩත්තුව, අලුතින් එක් කිරීම් සහ වැඩි දියුණු කිරීම
4. රජයේ නිවාසවල නඩත්තුව සහ මෙහෙයුම් කටයුතු
5. දෙපාර්තමේන්තුව මගින් සිදු කරන සියලු ගොඩනැගීම් කටයුතුවල තාක්ෂණික වගවීම තහවුරු කිරීම.
6. මහල් නිවාස අයිතිකම් (විශේෂ විධිවිධාන) පිළිබඳ 2018.05.25 දිනැති ගැසට් පත්‍රය අනුව සභාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම
7. අනෙකුත් ආයතන සඳහා තාක්ෂණ සහාය ලබාදීම
8. විශ්ව විද්‍යාල උපාධි අපේක්ෂක සහ අනෙකුත් ආයතන වල ශිෂ්‍යයන් සඳහා පුහුණු පහසුකම් සැපයීම
9. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව තුල සහ අනෙකුත් බාහිර දෙපාර්තමේන්තුවල සිවිල් ඉංජිනේරුවන්ට වරලත් ඉංජිනේරු තත්වය ලබා ගැනීමට සැලසුම් කාර්යාල පුහුණු පහසුකම් සැපයීම.
10. ගොඩනැගිලි ගාස්තු උපලේඛනය (***BSR)*** සැකසීම හා යාවත්කාලීන කිරීම.
11. ***UDA*** සාමාන්‍ය රෙගුලාසියට අනුව ගොඩනැගිලි තත්ත්ව වාර්තා සහතික කිරීම.

1.4 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ







4. පාලන අංශය
5. මුදල් අංශය
6. අභ්‍යන්තර විගණන අංශය


1.5 අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ ඇති ආයතන/ අරමුදල්

- අදාළ නොවේ -

පරිච්ඡේදය 02 — ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ආයතන ප්‍රධානී, ප්‍රධාන පරිපාලන නිලධාරි/ පරිපාලන නිලධාරී විසින් අත්සන් කළ යුතු විශේෂ ජයග්‍රහණ, අභියෝග සහ අනාගත අරමුණු කෙටියෙන් විස්තර කිරීම.

2.1 2023 දක්වා අතීත කාර්ය සාධනය




	2014	2015	2016	2017	2018	2019	2020	2021	2022	2023
Rehabilitation	344.80	363.13	603.43	502.77	446.62	283.49	278.61	493.71	59.92	59.27
New Buildings	1178.21	1940.68	3313.95	4759.63	4886.74	4527.99	1672.08	2417.96	2116.12	1555.15
Total	1523.01	2303.81	3917.38	5262.40	5333.36	4811.48	1950.69	2911.67	2176.04	1614.42

රූපය 3:2023 වසරේ ඉලක්ක සහ ප්‍රගතිය සංසන්දනය

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙනත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය ආයතනවල සේවාදායකයින්ට සේවාවන් සපයනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාව නව ගොඩනැගිලි සහ යටිතල පහසුකම් ඉදිකිරීම් සහ පුනරුත්ථාපන ලෙස වර්ග කළ හැක. වගුව 1 සහ රූප සටහන 4 හි පෙන්වා ඇති පරිදි දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය 2014 වර්ෂයේ රු. මිලියන 1523.01 සිට උච්චාවචනයන්ට ලක්වීම සිදු වූ අතර 2023 වර්ෂයේදී කාර්ය සාධනය රු. මිලියන 1614.42 විය. සේවාලාභියාට ප්‍රතිපාදන නොලැබීම, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය අර්බුදය සහ මිල ඉහල යාම (ආනයන සීමා, රජයේ රෙගුලාසි) හේතුවෙන් 2022 සිට 2023 දක්වා කාර්ය සාධනය 26% කින් අඩු වී ඇත. එසේ වුවද , අනෙකුත් ආයතන වල ඉදිරි සංවර්ධන කටයුතු සඳහා වූ ඇස්තමේන්තු ලබා දීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන් සිදු කරනු ලැබුණි. 2023 වර්ෂය සඳහා රු.මිලි. 21,830.72 ක පමණ ඇස්තමේන්තු සකස් කර අදාල ආයතන වෙත භාර දී ඇත.සේවා දායක ආයතන වෙත ප්‍රතිපාදන නොලැබීම මත ඇස්තමේන්තු අනුමත නොවී තිබූ අතර අනුමත වූ පසු ඉදිරි කටයුතු කිරීමට නියමිතය.(වගුව 4 හි සඳහන් වේ.).තවද රජයේ පවතින ගොඩනැගිලි සම්බන්ධ ගැටලු වලදී තීරණ ගැනීමට අවශ්‍ය තාක්ෂණික වාර්තා 72ක් 2023 වසරේදී ලබා දී ඇත.

වගුව 1: වාර්ෂික වැඩිවීම 2014-2023

වසර	වාර්ෂික කාර්යසාධනය	වර්ධනය %	වර්ධනය %
	රුපියල් මිලියන	(පදනම් වර්ෂය 2014)	(පදනම් වර්ෂය පෙර වසර)
2014	1523.01		
2015	2303.81	51	51
2016	3917.38	157	70
2017	5262.40	246	34
2018	5333.35	250	1
2019	4811.48	216	-10
2020	1950.69	28	-59
2021	2911.67	91	49
2022	2176.04	43	-25
2023	1614.42	6	-26




රූපය 4: කාර්ය සාධනයේ වර්ධනය

2022 සිට 2023 දක්වා දෙපාර්තමේන්තුව, 1 වගුවේ පෙන්වා ඇති පරිදි, නඩත්තු, වැඩි දියුණු කිරීම් කාර්ය සාධනය රු.මිලියන 2176.04 සිට රු.මිලියන 1614.42 දක්වා අඩු වී ඇත. පහත වගුව 2 , නඩත්තු හා වැඩි දියුණු කිරීම් සහ නව ගොඩනැගිලිවල කාර්ය සාධනය පෙන්වයි. 2022 සිට 2023 දක්වා නව ගොඩනැගිලි කාර්ය සාධනය 26% න් අඩු වූ අතර නඩත්තු හා වැඩි දියුණු කිරීම් 1% න් අඩු විය. සේවාලාභියාට ප්‍රතිපාදන නොලැබීම, කොන්ත්‍රාත්කරුවන්ගේ මූල්‍ය අර්බුදය සහ මිල ඉහල යාම (ආනයන සීමා, රජයේ රෙගුලාසි) හේතුවෙන් සම්මත ප්‍රගතිය අඩු වී ඇත.

අංශය	කාර්ය සාධනය (රු.මිලියන)		වර්ධනය % (පදනම් වර්ෂය පෙර වසර)
	2022	2023	
නඩත්තු හා වැඩි දියුණු කිරීම්	59.92	59.27	-1%
නව ඉදිකිරීම්	2116.12	1555.15	-26%
එකතුව	**2176.04**	**1614.42**	**-26%**

2.2 2023 වසරේ ව්‍යාපෘතිවල සාරාංශය



	Jan	Feb	March	April	May	June	July	Aug	Sep	Oct	Nov	Dec
2023 Target	260.45	520.75	823.76	630.30	961.22	1285.2	737.02	996.91	1226.0	1203.3	1487.7	1866.9
2023 Progress	158.64	237.48	302.97	380.90	437.74	504.10	674.50	775.25	869.09	992.26	1281.9	1614.4

රූපය 5- 2023 වසරේ ඉලක්ක සහ ප්‍රගතිය සංසන්දනය

දෙපාර්තමේන්තුව විසින් 2023 වර්ෂයේදී ව්‍යාපෘති 119 ක් හසුරුවා ඇති අතර එයින් ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 දක්වා වූ ව්‍යාපෘති 76 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 25 සිට මිලියන 100 දක්වා ව්‍යාපෘති 24 ක්, ව්‍යාපෘති වටිනාකම රු.මිලියන 100 සිට 200 දක්වා ව්‍යාපෘති 07 කි. ව්‍යාපෘති වටිනාකම රු. මිලියන 200 ට වඩා වැඩි ව්‍යාපෘති 12 ක් ඇත.

වගුව 3: 2023 වසරේ ඉදිකිරීම් අංශයේ සාරාංශය

කලාප කාර්යාලය	ව්‍යාපෘති වටිනාකම රුපියල් (මිලියන)				
	0-25	**25-100**	**100-200**	**>200**	**එකතුව**
බස්නාහිර/ දකුණ	06	03	02	03	**14**
බස්නාහිර/ උතුර	07	03	00	03	**13**
කලාප 2	11	01	00	00	**12**
කලාප 3	10	04	04	00	**18**
කලාප 4	27	04	00	01	**32**
කලාප 5	06	02	00	04	**12**
කලාප 6	09	07	01	01	**18**
එකතුව	76	24	07	12	**119**

වගුව 4: 2023 වසරේදී සේවාදායකයන් සඳහා ඉදිරිපත් කරන ලද ඇස්තමේන්තු

කලාප කාර්යාලය	**2023 වසරේ ඉදිරිපත් කල ඇස්තමේන්තු**	**අස්තමේන්තු වටිනාකම (රු.මිලියන)**
කලාප 01 - බස්නාහිර දකුණ	66	2,420.64
කලාප 01 - බස්නාහිර උතුර	57	1,080.47
කලාප 02	50	2,962.70
කලාප 03	39	2,249.50
කලාප 04	63	3,200.44
කලාප 05	61	3,344.22
කලාප 06	38	3,067.75
රජයේ රෝහල් වල සූර්ය පැනල සවිකිරීමේ විශේෂ ව්‍යාපෘතිය	46	3,505.00
එකතුව	**420**	**21,830.72**

2.3 උපදේශන අංශයේ කාර්ය සාධනය

දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන්හි මූලික අංශය වන්නේ උපදේශන අංශයයි. මෙම අංශය ගොඩනැගිලි හා ඒ ආශ්‍රිත යටිතල පහසුකම් සම්බන්ධ වාස්තු විද්‍යාත්මක, ව්‍යුහාත්මක, විදුලි, ජල සම්පාදන, මලාපවහන සහ යාන්ත්‍රික සැලසුම් සහ ප්‍රමාණ බිල්පත් යන ආකාරයෙන් නිර්මාණ සේවා සපයයි. ඉහත සේවාවන් සපයනු ලබන්නේ කැපවූ වෘත්තීය ගෘහ නිර්මාණ ශිල්පීන් සහ ඉංජිනේරුවන් විසිනි. 2019 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා උපදේශන අංශයේ කාර්ය සාධනය දළ සැලසුම් නිර්මාණ සහ සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ වශයෙන් වගුව 5 මගින් දක්වති.

වගුව 5(a) : 2023 වසරේදී වාස්තු විද්‍යා අංශයේ කාර්ය සාධනය

		2019	2020	2021	2022	2023
දළ සැලසුම් නිර්මාණ	ඉලක්කය	75	57	67	19	38
	ප්‍රගතිය	67	50	61	18	34
සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	48	23	55	21	14
	ප්‍රගතිය	43	12	40	14	12

වගුව 5(b) : 2023 වසරේදී ව්‍යුහාත්මක ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	51	36	40	19	28
	ප්‍රගතිය	66	09	42	14	12

වගුව 5(c) 20 :2 3වසරේදී ජල සම්පාදන හා මලාපවහන ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	58	25	56	21	20
	ප්‍රගතිය	45	17	52	18	14

වගුව 5(d) 20 :2 3විදුලි ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	62	26	64	21	17
	ප්‍රගතිය	60	24	63	21	17

වගුව 5(e) 20 :2 3යාන්ත්‍රික ඉංජිනේරු අංශයේ කාර්ය සාධනය

සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	26	25	61	24	13
	ප්‍රගතිය	26	25	61	24	13

වගුව 5(f) 20 :23 ඇස්තමේන්තු අංශයේ කාර්ය සාධනය

සවිස්තරාත්මක සැලසුම් නිර්මාණ	ඉලක්කය	38	20	26	13	7
	ප්‍රගතිය	26	8	29	10	4

2.4 සහාධිපත්‍ය දේපළ පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික ලබා දීම

ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් 2018.05.25 දින ගැසට් පත්‍රයේ ප්‍රකාශයට පත් කරන ලද මහල් නිවාස හිමිකාරීත්ව (විශේෂ විධි විධාන) පනතට අනුව සහාධිපත්‍ය දේපලෙහි ආරක්ෂාව සඳහා ගොඩනැගිලි සඳහා සහතික නිකුත් කිරීම සඳහා නිවාස ඒකක පරීක්ෂා කරන ලදී. 2023 වර්ෂය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (NHDA), හබරාදුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, අක්මීමන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය, මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සහ මාදම්පාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඉදිකරන ලද නිවාස ඒකක 720 ක් සඳහා 5 වගුවේ දක්වා ඇති පරිදි 2023 වසරේදී සහතික නිකුත් කරන ලදි.

වගුව 6: සහාධිපත්‍ය ව්‍යාපෘති - ඉදිකල මහල් නිවාස ගණන

	2022/12/31 දක්වා	**2023 වර්ෂය තුල**	**එකතුව**
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය	1038	599	1637
ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව	144	-	144
මහනුවර මහ නගර සභාව	32	-	32
හබරාදුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	-	37	37
අක්මීමන ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	-	36	36
මොරටුව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය(ගුඩ් විල් වත්ත)	-	24	24
මාදම්පාගම ප්‍රාදේශිය ලේකම් කාර්යාලය	-	24	24

පරිච්ඡේදය 03 - 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත අයවැය ප්‍රතිපාදන 2023		සටහන	කණ්ඩායම 2023	2022	
රු.			රු.	රු.	
-	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒකීය-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්				
-	භාණ්ඩාගාර අයිතම		1,744,858,000	1,033,698,000	ඒකීය-3
-	තැන්පතු		655,733,191	1,096,123,274	ඒකීය-4
-	අත්තිකාරම් ගිණුම්		25,680,234	24,592,206	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	මුළු ආදායම් නොවන ලැබීම් (ආ)		2,426,271,425	2,154,413,480	
	මුළු ආදායම් ලැබීම් සහ ආදායම්				
-	නොවන ලැබීම් ඇ = (අ)+(ආ)		2,426,271,425	2,154,413,480	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		110,000,000	-	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම්				
	නොවන ලැබීම් ඉ = (ඇ)-(ඇ)		2,316,271,425	2,154,413,480	
	අඩු කළා : වියදම්				
	පුනරාවර්තන වියදම්				
392,000,000	වැටුප්, වෙනත් සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	360,320,160	371,850,773	
141,100,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	154,946,611	136,578,828	ඒකීය-2(ii)
2,700,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	1,857,406	2,288,307	
-	පොළී ගෙවීම්	8	-	-	
200,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	128,377	116,792	
536,000,000	මුළු පුනරාවර්තන වියදම් (ඊ)		517,252,554	510,834,700	
	මූලධන වියදම්				
	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා				
14,900,000	වැඩිදියුණු කිරීම්	10	14,879,199	23,494,075	
1,400,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	1,890,775	1,488,889	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒකීය-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	-	-	
850,000	හැකියා වර්ධනය	14	834,013	989,425	
550,000	වෙනත් මූලධන වියදම්	15	39,350	470,029	
17,700,000	මුළු මූලධන වියදම් (උ)		17,643,337	26,442,418	
	තැන්පතු ගෙවීම්		1,384,230,520	1,065,443,813	ඒකීය-4
	අත්තිකාරම් ගෙවීම්		23,994,736	24,627,708	ඒකීය-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		1,408,225,256	1,090,071,521	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		1,943,121,147	1,627,348,639	
				-	
-	දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)		373,150,278	527,064,841	
	අවසාන ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		373,150,278	527,064,841	ඒකීය-7
	දෙසැම්බර් 31 දිනට අවසාන ශේෂය		-	-	ඒකීය-3
			-	-	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-8

2023 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	කණ්ඩායම 2023 රු.	2022 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	849,295,652	841,132,720
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	63,869,881	65,555,379
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	-	-
මුළු වත්කම්		**913,165,533**	**906,688,099**
ශුද්ධ වත්කම් / ස්වාමිත්වය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		(577,251,939)	(1,304,063,770)
දේපළ පිරියත හා උපකරණ සංචිතය		849,295,652	841,132,720
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)		
ප්‍රංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසිඒ-4	641,121,820	1,369,619,149
අනුම ශේෂය	ඒසිඒ-3	-	-
මුළු වගකීම්		**913,165,533**	**906,688,099**

පිටු අංක **01** සිට **35** දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක **36** සිට **76** දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුම්මෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන සිදුකෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශනයන්හි සටහන් මඟින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුම්මෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් ව්‍යවස්ථාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම සිදුකිරීමට එරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි
නම :	නම :	අධ්‍යක්ෂ (මූදල්)/ කොමිසාරිස් (මූදල්)
තනතුර :	තනතුර :	නම :
දිනය : 2024/02/27	දිනය : 26.02.2024.	දිනය : 2024.02.22
ඩබ්ලිව්.එස්. සහතහේදු SLAS (SPECIAL GRADE) MBA(Ballarat), PGD(La-Trobe),BSc (Sri Jayawardenepura) පළාත ආණ්ඩුක්‍රම හා නීතිය අමාත්‍යාංශය 12 වන මහල, "පෙත්සිරිපාය" II වන අදියර, බත්තරමුල්ල.	ඉංජි.කේ.පී. සන්ධ්‍යා කුමුදිනී ගොඩනැගිලි අධ්‍යක්ෂ ජනරාල් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව "පෙත්සිරිපාය" බත්තරමුල්ල	පී.වී. අනුෂා සජීවනී ප්‍රධාන ගණකාධිකාරී ගොඩනැගිලි දෙපාර්තමේන්තුව "පෙත්සිරිපාය", බත්තරමුල්ල.

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

ඒකක-සි

2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	කොටස	
	2023 රු.	2022 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් තොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙතුවෙන් එකතු කරන ලද ආදායම්	272,495,073	207,231,94
අග්‍රිම ලැබීම්	1,744,858,000	1,033,698,000
අත්තිකාරම් අයකර ගැනීම්	23,878,265	22,991,433
තැන්පතු ලැබීම්	655,733,191	1,096,123,274
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	2,696,964,530	2,360,064,652
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	513,030,848	507,561,343
සහනාධාර සහ ආරුණිරීම්	1,857,406	2,288,307
වෙනත් වැය ශීර්ෂ වෙතුවෙන් දරන ලද වියදම්	646,295,305	733,498,303
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	110,000,000	-
අත්තිකාරම් ගෙවීම්	23,907,114	24,830,468
තැන්පතු ගෙවීම්	1,384,230,520	1,065,443,813
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	2,679,321,193	2,333,622,234
	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	17,643,337	26,442,418
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
නිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම්	-	-
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
මූලධන වියදම්	17,643,337	26,442,418
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	17,643,337	26,442,418
	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඈ)-(ඉ)	(17,643,337)	(26,442,418)
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ඉද්ධ මුදල් ප්‍රවාහය (ඌ)=(ඇ) + (උ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඵ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඵ)-(එ)	-	-
මුදල්වල ඉද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

වාර්තා කිරීමේ පදනම

1. වාර්තාකරණ කාලය

මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා වාර්තා කිරීමේ කාලය 2023 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වේ.

2. මිනුම් කරන පදනම

මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ඇතැම් වත්කම් නැවත තක්සේරු කිරීම මගින් වෙනස් කරන ලද ඓතිහාසික පිරිවැය මත වන අතර වෙනත් ආකාරයකින් නිශ්චිතව දක්වා නොමැති නම්, වෙනස් කරන ලද මුදල් පදනමක් මත ගිණුම්ගත කර ඇත.

මූල්‍ය ප්‍රකාශනවල අගයන් ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්න රුපියලට වටයා ඉදිරිපත් කොට ඇත.

3. ආදායම් හඳුනා ගැනීම.

විනිමය සහ විනිමය නොවන ආදායම් අදාළ ආදායම් කාලසීමාව නොසලකා ගිණුම්කරණ කාලය තුළ මුදල් ලැබීම් මත හඳුනා ගැනේ.

4. දේපළ, පිරියත සහ උපකරණ හඳුනා ගැනීම සහ මැනීම (PP&E)

වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනය වෙත ගලා ඒමට සම්භාවිතාවක් ඇති විට දේපල, කම්හල සහ උපකරණ අයිතමයක් හඳුනාගෙන ඇති අතර වත්කම්වල පිරිවැය විශ්වාසදායක ලෙස මැනිය හැකිය.

PP&E පිරිවැයකින් මනිනු ලබන අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන විට නැවත ඇගයීමේ ආකෘතිය යොදනු ලැබේ.

5. දේපළ, පිරියත සහ උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපල , පිරියත සහ උපකරණවල අනුරූප ගිණුමයි.

6. මුදල් සහ මුදල් සමාන දේ

මුදල් සහ මුදල් සමානකම්වලට 2023 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය මුදල් නෝට්ටු සහ කාසි ඇතුළත් වේ.

- කිසියම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවක, අදාළ තොරතුරු ඇතුළත් කර අවශ්‍ය පරිදි ආකෘතිවලින් සංශෝධන සිදුකල හැකි අතර, මෙම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම් ‘‘වාර්තා කිරීමේ පදනම’’ යටතේ ඇතුළත් කළ හැක.
- වාර්තා කිරීමේ පදනම යටතේ වාර්තා කිරීමේ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් හෙළි කළ යුතුය.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු, 000.....

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය(රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාල නොවේ					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගි කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන්කරන ප්‍රතිපාදන(රු.)		තත්‍ය වියදම(රු.)	උපයෝගි කරනු ලැබූ ප්‍රතිපාදන, වෙන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්ථන	536,000,000.00	541,154,000.00	517,252,554.00	96%
ප්‍රාග්ධන	17,700,000.00	17,700,000.00	17,643,337.00	100%

3.6a මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු වල නියෝජිතයෙක් ලෙස මෙම දෙපාර්තමේන්තුවට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අංකය	අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ව්‍යාපෘති ගණන	ලැබුණු අරමුදල් - 2023	31-12-2023 දිනට මුලු වියදම	ඉතුරු මුදල (රු.)	ප්‍රගතිය (% ලෙස)
01	බුද්ධශාසන ,ආගමික, සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	01	6,340,616.75	6340,616.75	-	100.00
02	ආරක්ෂක අමාත්‍යාංශය	03	1,445,793.67	1,445,793.67	-	100.00
03	සෞඛ්‍ය අමාත්‍යාංශය	19	164,467,773.21	164,467,773.21	-	100.00
04	නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය	01	722,787.20	722,787.20	-	100.00
05	මහජන ආරක්ෂක අමාත්‍යාංශය	03	76,324,253.91	76,324,253.91	-	100.00
06	විදේශ රැකියා ප්‍රවර්ධන සහ වෙළඳපොල විවිධාංගීකරණය පිලිබඳ රාජ්‍ය අමාත්‍යාංශය	02	1,525,000.00	1,525,000.00	-	100.00
07	ජාතික කෞතුකාගාර දෙපාර්තමේන්තුව	03	51,044,554.98	51,044,554.98	-	100.00
08	ආයුර්වේද දෙපාර්තමේන්තුව	01	1,300,358.26	1,300,358.26	-	100.00
09	කම්කරු දෙපාර්තමේන්තුව	03	8,293,558.98	8,293,558.98	-	100.00
10	පොලිස් දෙපාර්තමේන්තුව	28	281,259,516.81	281,259,516.81	-	100.00
11	දේශීය ආදායම් දෙපාර්තමේන්තුව	02	7,285,460.30	7,285,460.30		100.00
12	සුරාබදු දෙපාර්තමේන්තුව	01	21,000,000.00	21,000,000.00	-	100.00
13	ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව	02	2,022,114.12	2,022,114.12	-	100.00
14	තක්සේරු දෙපාර්තමේන්තුව	01	786,500.00	786,500.00	-	100.00
15	කෘෂි අපනයන දෙපාර්තමේන්තුව	01	680,989.36	680,989.36	-	100.00
16	තැපැල් දෙපාර්තමේන්තුව	02	7,040,715.00	7,040,715.00	-	100.00
17	මැතිවරණ කොමිසම	01	7,241,215.00	7,241,215.00	-	100.00
18	ශ්‍රී ලංකා රේගු දෙපාර්තුමේන්තුව	02	3,951,995.95	3,951,995.95	-	100.00
19	ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය	01	1,311,730.09	1,311,730.09	-	100.00
	මුළු එකතුව	**77**	**644,044,933.59**	**644,044,933.59**	-	

3.7 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	කේත විස්තරය	සමීක්ෂණ මණ්ඩල වාර්තාවට අනුව ශේෂය **2023.12.31** දිනට(රු.)	**2023.12.31** දිනට මූල්‍ය තත්ව වාර්තාවේ ශේෂය (රු.)	ගණනය කිරීමට නියමිත	ප්‍රගති වාර්තා කිරීම % ලෙස
9151	ගොඩනැගිලි සහ ව්‍යුහ	112,302,689.29	112,302,689.29	-	100
9152	යන්ත්‍රෝපකරණ	271,515,239.10	271,515,239.10	-	100
9153	ඉඩම්	461,398,355.60	461,398,355.60	-	100
9154	අස්පෘෂ්‍යය වත්කම්	3,979,368.00	3,979,368.00	-	100
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	100,000.00	100,000.00	-	100
9180	කල්බදු වත්කම්	-	-	-	-

3.8**විගණකාධිපතිවරයාගේ වාර්තාව**

සීඒඊ/ඒ/බීඩී/එෆ්එස්/2023/01 2024 මැයි දින

අධ්‍යක්ෂ ජනරාල්
ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

ශීර්ෂය 309 - ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018අංක 19දරන ජාතික විගණන පනතේ (1)11වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

.1මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 309 -ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ 2023 දෙසැම්බර් 31දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2023 දෙසැම්බර් 31දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018අංක 19දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1)154 ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී 2018 .අංක 19දරන ජාතික විගණන පනතේ (1)11වගන්තිය ප්‍රකාරව ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (2)11වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (6)154ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018අංක 19දරන ජාතික විගණන පනතේ 10වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ .

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ .ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට)ශ්‍රී.ලං.වි.ප්‍ර (අනුකූලව මා විගණනය සිදු කරන ලදී .මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත .

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018අංක 19දරන ජාතික විගණන පනතේ 38වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ .

2018අංක 19දරන ජාතික විගණන පනතේ (1)16වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය .

ජාතික විගණන පනතේ)(1)38ඇ (උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය .

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ .සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත .වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී .

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී .මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි .

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී .

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි .

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018අංක 19දරන ජාතික විගණන පනතේ)(1)6ඈ (වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි .

)අ(මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට

)ආ(ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණු බවට

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය නොවන වත්කම්

(අ) මූල්‍ය ප්‍රකාශනයෙහි ACA-6 ආකෘතිය සහ භාණ්ඩාගාරික SA-82 ආකෘතියේ සඳහන් මූල්‍ය නොවන වත්කම් වර්ග 08 ක ආරම්භක ශේෂයන්ට රු. 77,537,055 ක් වූ වටිනාකම් සමාලෝචිත වර්ෂයේදී එකතු කර තිබුණි. මෙම වත්කම් 2022 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව භා.ගා 66 ආකෘතිය සමඟ සැසඳීමේදී නව සිගාස් පද්ධතිය වෙත ඇතුළත් නොවූ, 2023 වර්ෂයේදී හඳුනාගත් වත්කම් වේ. සත්‍ය වශයෙන්ම පවතින භෞතික වත්කම් සියල්ලම නව සිගාස් වැඩසටහනෙහි ඇතුලත්ද යන්න තහවුරු කර ගැනීමකින් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම මීට හේතු වේ.

(ආ) මූල්‍ය නොවන වත්කම් හඳුනා ගැනීම, ගිණුම්ගත කිරීම හා ඒවායේ පාලනය පහසු වීම පිණිස

මූල්‍ය නොවන වත්කම් වෙනුවෙන් දෙපාර්තමේන්තු අංකයක් අනුගමනය කළ යුතු වූවත් දෙපාර්තමේන්තුවේ නව සිගාස් වැඩසටහන මඟින් පාලනය වන වත්කම් ලැයිස්තුවේ ඇති කලාප අංක 02 හා 04 හි වත්කම් සඳහා යම් සංකේත අංකයක් යොදා නොමැති වීම හේතුවෙන් SA-82 හා ACA-6 ආකෘතීන් හි දක්වා ඇති මූල්‍ය නොවන වත්කම් ප්‍රමාණය සත්‍ය වශයෙන්ම දෙපාර්තමේන්තුවේ භෞතිකව පවතින වත්කම් ප්‍රමාණයද යන්න තහවුරු කළ නොහැකි විය.

1.6.2 තැන්පතු ගෙවීම්

මු.රෙ. 571(3) ප්‍රකාරව ඉකුත් වූ සියලුම තැන්පතු රාජ්‍ය ආදායමට බැර කල යුතු වූවත් 2023 දෙසැම්බර් 31 දින වන විට එසේ නිරවුල් නොකරන ලද 16/33 හා 13/52 තැන්පතු ගිණුම් 02 ක ශේෂයන් අවුරුදු 05 ට වැඩි රු. 53,108,686 ක්, අවුරුදු 3-5 අතර රු. 83,219,886 ක් හා අවුරුදු 2- 3 අතර රු.81,678,965 ක් ලෙස එකතුව රු. 218,007,537 ක් විය. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) අංක 16/33 දරණ තැන්පතු ගිණුමට අදාළව ඉදිකිරීම් ව්‍යාපෘතිවල ඉදිකිරීම් අවසන් කර දෝෂ නිවැරදි කිරීමේ කාලයද (Defects Liability period) අවසන් වී දීර්ඝ කාලයක් ගතවී තිබුණද නිවැරදි කළ යුතු දෝෂ නිවැරදි නොකිරීම හේතුවෙන් ව්‍යාපෘති 300 ක රැඳවුම් මුදල් තැන්පතු ගිණුමෙහි රඳවා තබාගෙන තිබුණි.

(ආ) ව්‍යාපෘති අතරමග නවතා දමා තිබියදී (Terminated) අදාළ රැඳවුම් මුදල් රජයේ ආදායමට හෝ අදාළ සේවාදායකයන්ගේ ගිණුමට බැර නොකොට වසර දෙකකට වඩා වැඩි කාලයක් 16/33 තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

(ඇ) නියමිත කාර්යසාධනයක් නොවීම හේතුවෙන් නවතා දැමූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 10 ක් සඳහා තබා තිබූ වටිනාකම රු. 36,132,685 ක් වූ කාර්යසාධන සුරක්ෂණයන් 2023 වර්ෂයේදී මුදල් කර (En-cash) තිබුණද එම මුදල් අදාළ සේවාදායක ආයතනය වෙත හෝ රජයේ ආදායමට හෝ බැර නොකොට 2023 දෙසැම්බර් 31 දිනට අංක 13/52 දරණ තැන්පතු ගිණුමෙහි රඳවාගෙන තිබුණි.

1.6.2 අත්තිකාරම්

(අ) සමාලෝචිත වර්ෂයට අදාළව සේවයෙන් ඉවත් වීමට ඉල්ලීම් කර තිබුණද රජයට අයවිය යුතු මුදල් නොගෙවීම නිසා නිදහස් නොකල නමුත් සේවයට වාර්තා නොකරන ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ කාර්මික නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු. 221,439 ක් වූ මුදලක් ණය ශේෂය තුල පවතී.

(ආ) විශ්‍රාම ගිය නිලධාරින්ගෙන් අය විය යුතු ණය ශේෂය තුල වර්ෂ 5-10 අතර කාලයක සිට පවතින ශේෂය රු. 115,861 ක් ද වර්ෂ 1-3 අතර කාලයක් ගත වූ අයවිය යුතු ශේෂ රු. 380,304 ක් ද

පවතින අතර මියගිය නිලධාරින්ගෙන් අයවිය යුතු ණය ශේෂ තුල 2021.03.11 මිය ගිය නිලධාරියකුගේ ශේෂය රු. 174,487 ක් වර්ෂ 3 කට වැඩි කාලයක සිට අය නොවී පවතී.

.2මූල්‍ය සමාලෝචනය

2.1වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය

(අ) මු.රෙ 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු ඒවායෙහි ඉදිකිරීම් කටයුතු කරගනු පිණිස ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත 2023 වර්ෂයේදී පවරා දෙනු ලැබූ රු.1,335,896,343 ක් වූ ප්‍රතිපාදනයන්ගෙන් රු. 644,102,933 ක් එනම් ප්‍රතිපාදිත මුදලින් සියයට 48 ක් පමණක් උපයෝජනය කර තිබුණි. ඉතිරි රු. 691,793,409 ක් වූ ප්‍රතිපාදන උපයෝජනය නොකොට නැවත හරවා යවා තිබුණි. එය මුළු ප්‍රතිපාදනයෙන් සියයට 52 ක් වේ. මේ තුල මුළු ප්‍රතිපාදනයම උපයෝජනය නොකළ ව්‍යාපෘති 08 ක් පවතින අතර එහි මුළු ප්‍රතිපාදනයෙහි වටිනාකම රු.310,934,000 ක් විය.

(ආ) 2022 අංක 43 දරන විසර්ජන පනතේ 6(1) වගන්තියේ සඳහන් පරිපූරක සහය සේවා සහ හදිසි අවස්ථා වගකීම් ව්‍යාපෘති මඟින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පරිපූරක ඇස්තමේන්තුවෙන් වෙන් කර දී තිබූ රු. 5,154,000 ක ප්‍රතිපාදනයෙන් අදාළ පරිදි ප්‍රධාන වායුසමන පද්ධතිය අළුත්වැඩියාව සඳහා යොදාගෙන තිබූ ප්‍රතිපාදනය රු. 4,757,237 ක් පමණක් වන අතර වෙනත් කාර්යයන් සඳහා රු. 276,638 ක් යොදවාගෙන තිබුණි. එමෙන්ම මින් රු.120,124 ක මුදලක් ඉතිරි ශේෂය ලෙස මූල්‍ය ප්‍රකාශනයෙහි පෙන්වා තිබුණි.

2.2නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි අංක 1645	පවත්වා ගතයුතු ලොග් සටහන් පොත් යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.
(ආ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 8.8.1. (අ)	අසාර්ථක වූ ලංසුකරුවන් වෙත විශේෂ අඩු පාඩු පෙන්නුම් කරමින් ලංසුව අසාර්ථක වීමට බලපෑ හේතු දැනුම් දී නොතිබුණි.

(ඇ)	භාණ්ඩාගාර ලේකම්ගේ අංක MF/CG/02/(iv) හා 2017.06.28 දිනැතිව නිකුත් කර ඇති 01/2017 වත්කම් කළමනාකරණ චක්‍රලේඛය.	වත්කම් හා පිරිවැය කළමනාකරණය සඳහා රජයේ සියලු මූල්‍ය නොවන වත්කම් ලේඛනගත කිරීම යටතේ කොම්ප්ට්‍රෝලර් ජනරාල්ට යැවිය යුතු තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1දැක්ම හා මෙහෙවර

තාක්ෂණික වගකීම අපේක්ෂිත ගුණාංග හා තිරසාර බව, පිරිමැසුම්දායක බව, ගුණාත්මක භාවය, සාක්ෂාත් කරමින් තම සේවා දායකයන් පූර්ණ තෘප්තියට පත් කිරීම උදෙසා විවිධ වෘත්තීන්හි එසේම තත්කාර්යයන් සඳහා ඇප කැපවූ වෘත්තිකයන් පිරිසක් විසින් වාස්තු විද්‍යාත්මක හා ඉංජිනේරුමය නිර්මාණද ඉදිකිරීම් ව්‍යාපෘති කළමනාකරණය සහ තාක්ෂණික, නඩත්තු කිරීම්, උපදෙස් සැපයීම මඟින් රාජ්‍ය අංශයේ ගොඩනැගිලි ඉදිකිරීමේ කාර්යයන් වැඩි දියුණු කිරීම වස් විශිෂ්ඨ සේවාවන් සැපයීම.

3.1.1කාර්යසාධනය

මුදල් රෙගුලාසි 787 ප්‍රකාරව සාමාන්‍ය නියමය වනුයේ රජයේ සියළුම නිර්මාණ හා වැඩ ක්‍රියාත්මක කිරීම පිළිබඳව රජයේ වැඩ දෙපාර්තමේන්තුව එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වගකිව යුතු බවයි. මෙම කාර්යයන් හා අනෙකුත් ඉදිකිරීම් කාර්යයන් ඉටුකිරීම වෙනුවෙන් දෙපාර්තමේන්තුව සතුව 2023 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් පරිදි ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ ඉංජිනේරුවන් 73 කින්ද, ජ්‍යෙෂ්ඨ මට්ටමේ ගෘහ නිර්මාණ ශිල්පීන් 12 ක්ද ඇතුළුව සැලසුම් ශිල්පීන්, ප්‍රමාණ සමීක්ෂකයින් හා තාක්ෂණික නිලධාරීන් 205 කින් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුයුක්තව සිටියද කාර්යසාධනය පහත සඳහන් පරිදි දුර්වල තත්ත්වයක විය.

3.1.2 දේපල පදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික නිකුත් කිරීම.

(අ) 2018 අගෝස්තු 15 දිනැති 2018 අංක 23 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (විශේෂ විධිවිධාන) පනතෙහි 3.(3)(1) උපවගන්තිය ප්‍රකාරව සහාධිපත්‍ය දේපළ ලියාපදිංචිය සඳහා ආරක්ෂිත බවට සහතික කරමින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලිඛිත ප්‍රකාශයක් එම සහාධිපත්‍ය ලියාපදිංචි කරන අවස්ථාවේදී නිකුත් කළ යුතුය. මෙලෙස සහතිකය ලබාගැනීමට දේපල 61 කට අදාළ තොරතුරු ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත යොමු කර තිබුණද 2023 දෙසැම්බර් 31 දින වන විටත් ලබා දී තිබුණේ සහතික 49 ක් පමණි. මෙයින්ද ඒකක 29 ක් සඳහා පමණක් ඔප්පු ලබා දීමට කටයුතු කල හැකි බව ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ වැඩ බලන සමාන්‍යාධිකාරී විසින් දන්වා එවා තිබුණි. මෙම පනත ආරම්භ වන දින සිට වසර පහක කාලසීමාවක් සඳහා ක්‍රියාත්මක

විය යුතු බව පනතෙහි 2 වන වගන්තිය මඟින් දක්වා තිබුණු අතර 2023 අගෝස්තු 18 දින වන විට එම කාල සීමාව සම්පූර්ණ වී තිබුණද ආරක්ෂිත සහතික නිකුත් නොකිරීම හේතුවෙන් බලාපොරොත්තු වූ අරමුණ ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

2022 දෙසැම්බර් 31 දිනට ජාතික නිවාස සංවර්ධන අධිකාරියේ පරීක්ෂා කරන ලද සභාධිපතය දේපල ඒකක 710 ක් පැවතුණු අතර 2023 වර්ෂය තුලදී නිකුත් කර තිබූ සහතික ගණන 599 ක් පමණක් විය.

(ආ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි 2009 දෙසැම්බර් 31 දිනට පෙර ඉදිකර ඇති සුනාමි හා අනෙකුත් මහල් නිවාස සංකීර්ණවල ඇති පහත සඳහන් නිවාස සම්බන්ධයෙන්ද මෙතෙක් පදිංචියට සුදුසුද යන්න පරීක්ෂා කර සහතික ලබා දීමට කටයුතු කර නොතිබුණි.

i. රත්මලාන රස්ටම්වත්ත මහල් නිවාස සංකීර්ණය

මෙම නිවාස 321 කින් යුතු මහල් නිවාස සඳහා වූ සහතික 2021 ජූලි 22 දිනැති අංක RAT/LAN/09/F1/122(i) දරන ලිපිය මගින් ප්‍රාදේශීය ලේකම් විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙතින් ඉල්ලීම් කර තිබුණද එම සහතික ලබා දී නොතිබුණු අතර 2024 ජනවාරි 11 දින නැවත සිහිකැඳවීම් ලිපිද යවා තිබුණද මෙ දක්වා සහතික නිකුත් කර නොතිබුණි.

ii. ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් සහතික පත්‍ර නිකුත් කරන ලෙස ඉල්ලා තිබූ පානදුර මෝදරවිල තට්ටු නිවාස සංකීර්ණය, මාතර නූපේවෙල රීනේෂන් සිටි නිවාස ව්‍යාපෘතිය, කළුතර තේක්කවත්ත, මතාජී නිවාස, ජෙසුයිට් නිවාස, රතු කුරුස නිවාස යන නිවාස සංකීර්ණ හා රත්මලාන කඳවලවත්ත සුනාමි මහල් නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය සඳහා අනාරක්ෂිත තත්ත්වයන් පිළිසකර කිරීමට සුදුසු යෝජනා හා පියවරද සඳහන් නොකොට මෙම නිවාස සඳහා සහතික ලබා නොදීම හේතුවෙන් නිවාස වන්දි ලබාදිය නොහැකිව පවතින බව නිරීක්ෂණය විය.

(ඇ) ගොඩනැගිලි ගාස්තු උපලේඛණය (BSR) සැකසීම හා යාවත්කාලීන කිරීම ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් ලෙස දක්වා තිබුණු අතර 2023 වර්ෂයේ ගොඩනැගිලි ගාස්තු උපලේඛණය යාවත්කාලීනව පිළියෙල කර තිබුණද ඒකකයකට සහ විවිධ වර්ග ප්‍රමාණයන්ට අවශ්‍ය ශ්‍රමය, අමුද්‍රව්‍ය ආදී වශයෙන් වූ සම්මතයන් (Norms) 1988 වර්ෂයෙන් පසු යාවත්කාලීන කර නොතිබුණි. එම නිසා ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා ප්‍රමාණ පත්‍ර පිළියෙල කිරීමේදී වර්තමානයේ දියුණු තාක්ෂණික මෙවලම්, යන්ත්‍ර සූත්‍ර යොදාගැනීමෙන් ශ්‍රමයෙහි ඇති වන වෙනස්කම් හා සාම්ප්‍රදායික සිමෙන්ති, ගඩොල්, වැලි වෙනුවට යොදාගන්නා විකල්ප අමුද්‍රව්‍ය හේතුවෙන් ඇතිවන වෙනස්කම් සමඟ ද මෙම සම්මතයන් වෙනස් නොවීම හේතුවෙන් ඒවා වර්තමානයේ යොදාගැනීම තාත්ත්වික නොවන බව නිරීක්ෂණය විය.

3.1.3 අසම්පූර්ණ ව්‍යාපෘති සම්බන්ධයෙන් කාර්ය සාධන වාර්තාවෙහි තොරතුරු වරදවා දැක්වීම.

(අ) ඉදිකිරීම් කොන්ත්‍රාත්වල ගිවිසුම්ගත අගය මෙන්ම මිළ විචලනයන්ද සම්පූර්ණයෙන්ම සේවාදායක ආයතනය විසින් ගෙවා තිබියදී ඉදිකිරීම් කටයුතු සම්පූර්ණ නොකර විෂයපථය සීමාකොට, ව්‍යාපෘතිය

සම්පූර්ණ කළ ව්‍යාපෘතියක් යනුවෙන් කාර්යසාධන වාර්තාවන්හි දක්වා තිබුණි. තවද විෂයපථය සීමා කිරීම සේවාදායක විසින් ඉල්ලා නොමැති අවස්ථාවන්හිදී ඇස්තමේන්තුගත පිරිවැය සත්‍ය පිරිවැයට සමාන වූවද කාර්යයන් පමණක් ඉටු නොවීම හේතුවෙන් අතරමග නැවතී ඇති මෙම ව්‍යාපෘතිවලින් බලාපොරොත්තු වූ ප්‍රයෝජනය ලබාගත නොහැකි තත්ත්වයක ඇති බැවින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ කාර්යයන් ඉටුකිරීමේ සැබෑ ප්‍රගතිය මෙමගින් පිළිබිඹු නොවේ.

(ආ) ව්‍යාපෘති 10 ක කාර්යසාධනය නියමාකාරයෙන් ඉටු නොකිරීම මත කාර්යසාධන සුරක්ෂණය මුදල් බවට පත්කර (En-cash) අදාල මුදල් තැන්පත් ගිණුමෙහි රඳවා තබාගනිමින් එම ව්‍යාපෘති සියයට සියයක් නිමවා සේවාදායක ආයතනය වෙත භාරදුන් ලෙස දෙපාර්තමේන්තුවේ කාර්යසාධන වාර්තාවේ සටහන් කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය.

3.1.4අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගත් ඉදිකිරීම් ව්‍යාපෘති

(අ) ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාවෙහි මූලස්ථාන ගොඩනැගිල්ල සඳහා යෝජිත දිගු කිරීම් සහ වෙනස් කිරීම් සඳහා වූ ව්‍යාපෘතිය.

i. දෙපාර්තමේන්තුව විසින් උපදේශනය සහ කලමනාකරණ සේවා සැපයීම අරමුණු කර ගනිමින් රු.12,300,000 ක මූලික පිරිවැය ඇස්තමේන්තුවක් මත ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තෝරා ගන්නා ලද පෞද්ගලික ආයතනයක් වෙත කොන්ත්‍රාත් ඇස්තමේන්තුවේ වටිනාකමට වඩා සියයට 33 කින් අඩු වූ රු.8,191,437 ක ලංසු වටිනාකමට කොන්ත්‍රාත්තුව ප්‍රදානය කර තිබුණි.

ii. ඉංජිනේරු ඇස්තමේන්තුව හා කොන්ත්‍රාත්කරුගේ මිල කියුමෙහි අනුප්‍රමාණය අතර සියයට 550 සිට සියයට 99 දක්වා පරාසයක් තුල විචලනයක් නිරීක්ෂණය විය. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (අ) අනුව එවැනි අතාත්වික සඳහා පැහැදිලි කිරීම් ලබා ගත යුතු වූවත් එවැනි පැහැදිලි කිරීම් ලබාගත් බවට තහවුරු කෙරෙන සාක්ෂි ලිපිගොනු තුල නොවීය. එසේම මේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශ සංග්‍රහයේ 7.9.11 (ආ), (ඇ) ප්‍රකාරව කටයුතු කර තිබූ බවට සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය. තවද, මූලික ඇස්තමේන්තුවෙන් වෙන් කොට දී තිබූ රු.829,059 ක් වූ අවිනිශ්චිතතා සඳහා වෙන්කිරීම ඉක්මවා රු. 1,992,487 ක් කොන්ත්‍රාත්කරු වෙත ගෙවා තිබුණි.

iii. කොන්ත්‍රාත් කාලය දින 182 ක් වන අතර 2019 වර්ෂය අවසන් වීමට පෙර අදාල ඉදිකිරීම් නිම කර දෙන ලෙස සේවාදායක ආයතනය ඉල්ලා සිටියද ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත්කරුට ව්‍යාපෘතිය පිරිනමා තිබුණේ 2019 දෙසැම්බර් මස 06 දින වන අතර 2023 දෙසැම්බර් 31 දින දක්වාම නිම කර නොතිබුණි.

iv. ගිවිසුම්ගත වීමේදී පැවති කොන්ත්‍රාත්කරුගේ තනිපුද්ගල ව්‍යාපාරය 2021 ජුනි 23 දින සිට සමාගමක් බවට පත්කර තිබුණි. එසේ තිබියදී 2021 ජුනි 23 දිනෙන් පසු දෙපාර්තමේන්තුව විසින්

රු.5,784,594 ක් වටිනා චෙක්පත් නීතියෙන් වසන ලද පැරණි තනිපුද්ගල ව්‍යාපාරය නමට නිකුත්කර තිබුණි. එමෙන්ම නව ගිවිසුම් ඇති කර ගැනීම කෙරෙහි දෙපාර්තමේන්තුව අවධානය යොමු කර නොතිබුණි.

v. කොන්ත්‍රාන්තුව සඳහා වූ කාර්යසාධන සුරක්ෂණ, ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල වෙතින් ලබා ගෙන තිබුණු අතර එහි කාලය 2022 සැප්තැම්බර් 30 දින කල් ඉකුත් වන බවත් එහෙයින් ඒවායෙහි කාලය දීර්ඝ කර දෙන ලෙස හෝ කොන්ත්‍රාත්කරු ව්‍යාපෘතිය නිම කිරීමට අපොහොසත් වීම මත අදාල සුරක්ෂණයන් මුදල් බවට හරවා දෙන ලෙස දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටියද නීතියෙන් වසන ලද සමාගමක සුරක්ෂණයන් සඳහා කාලය දිගු කල නොහැකි බව ඉදිකිරීම් ආරක්ෂණ අරමුදල දන්වා තිබුණි.

vi. රු.8,191,437 ක ලන්සු වටිනාකමක් යටතේ සම්පූර්ණ කිරීමට ගිවිසුම් ගත වී තිබුණු මෙම

vii. කොන්ත්‍රාන්තුව සඳහා ශ්‍රී ලංකා කෘෂිකාර්මික පර්යේෂණ ප්‍රතිපත්ති සභාව රු.12,217,304 ක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත ගෙවා තිබුණද 2023 දෙසැම්බර් 31 දක්වාම ව්‍යාපෘති නිම වී නොතිබුණු අතර ව්‍යාපෘතිය සම්පූර්ණ කල ලෙස 2023 දෙසැම්බර් 31 දිනට විගණනයට ඉදිරිපත් වූ ව්‍යාපෘති කාර්යසාධනය දැක්වෙන වර්තාවෙහි දක්වා තිබුණද ඉතිරි වැඩ කොටස නිම කිරීමට රු.9,702,000 (වැට් රහිත)ක මූලික ඇස්තමේන්තුවක් කෘෂිකාර්මික ප්‍රතිපත්ති සභාව වෙත 2023 ඔක්තෝබර් 11 දින ඉදිරිපත් කර තිබුණි. නියමිත කාලය තුල ව්‍යාපෘතිය නිම නොකිරීම හේතුවෙන් ගොඩනැගිල්ල ප්‍රයෝජනයකට ගැනීමට හැකි තත්ත්වයකට පත්කිරීමට රජයට රු.9,702,000 (වැට් රහිත)ක මුදලක් මේ වෙනුවෙන් අමතරව දැරිය යුතුව ඇති අතර එසේ නොවුනහොත් මෙතෙක් වැය කල මුදලින්ද බලාපොරොත්තු වූ ප්‍රයෝජනය ලබාගත නොහැකි තත්ත්වයක් පවති.

3.1.5 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

(අ) වෙනත් රාජ්‍ය ආයතන වෙත අයවැයෙන් වෙන්කර තිබුණු ප්‍රතිපාදන ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පවරා ගනිමින් ඉටු කරනු ලබන කොන්ත්‍රාත් සඳහා දීර්ඝ කාලයක් තිස්සේ කොන්ත්‍රාන්තුව ඉටු කර අවසන් කරවා නොගැනීමෙන් වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ භාණ්ඩාගාරයෙන් මුදල් නොලැබීම මත කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීමෙන් කුරුඳුවත්ත පොලිස් ස්ථානයේ තනිකඩ බට නිවාස ඉදිකිරීම, දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ මඩකලපුව කාර්යාලයේ විදුලි උත්පාදන යන්ත්‍ර හා වායු සමීකරණ යන්ත්‍ර සපයා සවිකිරීම, වැල්පොතුවැව කොබෙයිගනේ මධ්‍යම බෙහෙත් ශාලාව ඉදිකිරීම, වරකාපොළ කම්කරු කාර්යාලය, මහඔය සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි කාර්යාලය ගොඩනැගිල්ල ඉදිකිරීම - අදියර 04 යනාදී ව්‍යාපෘති අත්හිටුවා තිබුණි.

(ආ) රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන විසින් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව වෙත පසුගිය වසර 06 ක කාලසීමාවක් තුල පිරිනමන ලද රුපියල් මිලියන 659 ක් ඉක්මවූ ඉදිකිරීම් කොන්ත්‍රාත් 23 ක් නිම කිරීමකින් තොරව අතරමග නවතා දමා තිබුණි.

(ඇ) හෝමාගම ප්‍රාදේශීය සභාවේ වෑතර උපකාර්යාල ගොඩනැගිලි (අදියර II) ඉදිකිරීම.

ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ ඉල්ලීම පරිදි ව්‍යාපෘති කළමනාකරණ සේවා සැපයීම වෙනුවෙන් වූ කොන්ත්‍රාන්තුවකට රු.30,000,000 ක පිරිවැයකින් යුත් ඇස්තමේන්තුවක් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව විසින් සකස් කර ඉදිරිපත් කර තිබුණි. ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ අතිරේක අංක 35 හි 2.14.1, 2.7.5, 2.8.4 හා 5.3.1 (ඇ), 5.4.8 වගන්තීන්ට අනුකූල නොවී තෝරාගත් කොන්ත්‍රාත්කරුගේ තනි පුද්ගල ව්‍යාපාරය 2021 සැප්තැම්බර් 01 වන දින සිට නීතියෙන් වසා දමා සමාගමක් බවට පත්කර තිබුණද ඒ පිළිබඳව දෙපාර්තමේන්තුව දැනුවත් කර තිබුණේ 2022 සැප්තැම්බර් 09 දිනයි. කෙසේ වෙතත් 2021 ඔක්තෝබර් 05 දින රු.1,076,424 ක් වටිනා කාර්ය සාධන සුරක්ෂණයක් හා රු.4,568,719 ක් වටිනා අත්තිකාරම් සුරක්ෂණයක් සෙලාන් බැංකුව හරහා ඉදිරිපත් කර තිබුණේ තනි පුද්ගල ව්‍යාපාරය නමිනි. කාර්ය සාධන සුරක්ෂණය මුදල් කිරීමට යාමේදී නෛතික පුද්ගලභාවයක් නොමැති කොන්ත්‍රාත්කරුවකු වෙනුවෙන් මුදල් ලබා දිය නොහැකි බව කොන්ත්‍රාත්කරු විසින් දන්වා තිබුණි. ව්‍යාපෘතිය අතරතුරදී ව්‍යාපාරය නීතියෙන් වසා දැමීමත් නව ව්‍යාපාරයක් පිහිටුවීමත් කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව වලංගුද යන්නත් අලුතෙන් පිහිටවූ ආයතනයට මෙවැනි පසුගිය දත්ත තිබේද යන්නත් සම්බන්ධයෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව සොයා බලා නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

කොන්ත්‍රාත් මුදල රු.21,528,447 ක් ලෙස ගිවිසුම්ගත වූ ව්‍යාපෘතිය සඳහා අඩු කරන ලද විෂය පථයක් යටතේ රු.17,846,691 ක් පමණක් වියදම් දරා තිබියදිත් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාරව වැඩ නිම කොට ඇති බවට දෙපාර්තමේන්තුව විසින් වැඩ නිම කිරීමේ සහතිකය නිකුත් කොට තිබුණි. එසේ වුවද ව්‍යාපෘතිය සම්පූර්ණ වී ප්‍රයෝජනයට ගත හැකි මට්ටමක නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ඇ) කණිෂ්ඨ පොලිස් නිලධාරීන්ගේ විවාහක නිලනිවාස ඉදිකිරීමේ කොන්ත්‍රාන්තුව.

ව්‍යාපෘතියේ කොන්ත්‍රාත් වටිනාකම රු.482,424,569 ක් වන අතර දින 910 ක දී එනම් 2022 මැයි 17 දින වන විට අවසන් කිරීමේ එකඟතාවයක් මත පුද්ගලික සමාගමක් සමඟ 2017 දෙසැම්බර් 18 දින ගිවිසුමකට එළඹ තිබුණි. මෙම කොන්ත්‍රාන්තුවේ ප්‍රසම්පාදන හා කළමනාකරණ කටයුතු සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවද ඉංජිනේරු ලෙස මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශයද පත්කර තිබුණි. බිල්පත් පරීක්ෂා කිරීමේ උපරිම කාලය දින 21 ක් වූවද එම කාලය දින 28 ත් 100 ත් අතර කාලයක් ගෙන තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කරු හා ඉංජිනේරු අතර ඇතිවූ නොඑකඟතාවය මත ගැටළු කිහිපයක් බෙරුම්කරුවකු වෙත යොමුකොට තිබුණි.

ගැටළු අංක 02 ලෙස, 2017 නොවැම්බර් 20 සිට 2019 අගෝස්තු 20 දක්වා වූ කාලය තුල ස්ථිරව වැඩ කිරීම සම්බන්ධයෙන් සේවායෝජක එනම් ගොඩනැගිලි දෙපාර්තමේන්තුව කොන්ත්‍රාන්තුවේ කොන්දේසි කඩකර තිබීම හේතුවෙන් කොන්ත්‍රාත්කාර සමාගම වෙත රු.18,293,273 ක මුදලක් ගෙවීමටත්, ගැටලු අංක 3, 4, 5 වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත අමතර ගෙවීම් නොගෙවීමටත් ගැටලු අංක 06 ප්‍රමාද ගෙවීම් වෙනුවෙන් කොටසක් ගෙවීමටත් අවසාන තීරණයේදී බෙරුම්කරු විසින් දන්වා

තිබුණි. ඉහත කරුණු අනුව කොන්ත්‍රාත්කරු හා සේවායෝජකගේ නොසැලකිලිමත් බව හේතුවෙන් වූ බිල්පත් ගෙවීම් ප්‍රමාදය මත ප්‍රමාද පොලි ගෙවීම රජයේ අරමුදලින් දැරීම සාධාරණ නොවුනද රු.5,322,685 ක ප්‍රමාද පොලියක් විගණිත දිනය වූ 2024 පෙබරවාරි 26 දින වන විට ගෙවා තිබුණි.

කොන්ත්‍රාත්කරුගේ දුර්වලතා සම්බන්ධයෙන් මධ්‍යම ඉංජිනේරු උපදේශක කාර්යාංශය අවස්ථා කිහිපයකදී දන්වා තිබුණද කොන්ත්‍රාත් ගිවිසුමෙහි 8.7 වගන්තිය ප්‍රකාරව ද්‍රවශීලතා පාඩු සඳහා කිසිදු මුදලක් අයකර නොතිබුණි.

3.2 වත්කම් කළමනාකරණය

(අ) මහල් නිවාස 05 ක් ඇතුළත්ව දෙපාර්තමේන්තුව සතු ඉඩම් 45 ක් පවතින අතර ඉන් ඉඩම් 29 ක් සඳහා හිමිකම් ඔප්පු සකස් කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව සතු ඉඩම් 45 අතුරින් ඉඩම් 25 ක් සඳහා තක්සේරු වටිනාකම් වෙන් වෙන් වශයෙන් හඳුනාගත නොහැකි වීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කරන ඉඩම් වටිනාකම නිවැරදි නොවන අඩු අගයන් පෙන්නුම් කරයි.

(ඇ) 2020 මාර්තු මාසයේ සිට සංචාරකයන් වෙත තංගල්ල සංචාරක බංගලාව ලබාදීමට නොහැකි වූ අතර නිසි ක්‍රමවේදය යටතේ මුදල් ගෙවා වෙන්කරවා ගැනීමකින් තොරව බාහිර පුද්ගලයන් පිරිසක් රැඳී සිටින ලදි. එම හේතුවෙන් විදුලිය හා ජලය ගාස්තු අසාමාන්‍ය ලෙස වර්ධනය වූවද බංගලාවේ නඩත්තු වෙනුවෙන් වියදම් දැරීමට කිසිදු ආදායමක් ලැබී නොතිබුණි. මෙතෙක් දැරූ විදුලිය සහ ජලය වියදම වූ රු.699,387 ක මුදල හා 2023 නොවැම්බර් 16 දිනට ගෙවිය යුතු හිඟ විදුලිය හා ජල වියදම රු.95,185 ක මුදල ප්‍රතිපූර්ණය කර ගෙන නොතිබුණි. තවද මේ හේතුවෙන් සංචාරකයන් වෙත බංගලාව කුලියට දී ලබා ගත හැකිව තිබූ ආදායම රජයට අහිමිව ගොස් තිබුණු අතර මෙහි අලුත්වැඩියා කටයුතු වෙනුවෙන්ද රජයට වියදම් දැරීමට සිදු වේ. මෙම අලාභය අයකර ගැනීමට හෝ අදාල පිරිස් ඉවත් කිරීම සඳහා බලධාරීන් අදාළ කාල පරිච්ඡේදයේ ඵලදායී මෙන්ම නීතිමය පියවරක් ගෙන නොතිබුණි.

(ඈ) නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි ඉඩමේ කොටසක් අනවසර පුද්ගලයන් විසින් අත්පත් කරගෙන තිබුණ අතර එම ඉඩම මැනුම් කටයුතු සිදුකර හිමිකම් ඔප්පු ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) දෙපාර්තමේන්තුව සතු දියතලාව ඉඩම ප්‍රාදේශීය ලේකම් විසින් පවරා ගෙන ඇති අතර ඒ වෙනුවට හපුතලේ ඉබ්බන් ආර ප්‍රදේශයේ ඉඩමක් ලබාදීමට නියමිත බව දැන්වූවත් ඔප්පු ලබාගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

3.3කළමනාකරණ දුර්වලතා

(අ) වාහන අළුත්වැඩියාවේදී ගලවා ඉවත් කරනු ලබන වාහන අමතර කොටස් විධිමත්ව ලේඛණගත කර ගබඩාවට භාරදුන් බව තහවුරු විය යුතු වූවද, එසේ නොවූ අතර මෙම අමතර කොටස් විධිමත්ව වෙන්දේසි කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) දෙපාර්තමේන්තුව විසින් කොන්ත්‍රාත් පිරිනැමීමේදී ලංසු පරීක්ෂාවේදී අදාල ලංසුකරුවන් විසින් ආයතනය තුල පෙර සිදුකරන ලද ව්‍යාපෘති, දිගින් දිගටම ප්‍රමාද වීම කාර්යය ඉටු නොකර අතරමැද අතහැර දමා ගිවිසුම් අවලංගු කිරීම, කාර්ය සාධන සුරක්ෂණ මුදල් කර ගැනීමට නිර්දේශ වූ කොන්ත්‍රාත්කරුවන් වෙත ද අසාදු ලේඛණගත කිරීමෙන් තොරව දිගින් දිගටම කොන්ත්‍රාත් පැවරීම සිදු කරන අවස්ථා නිරීක්ෂණය විය.

4. තිරසර සංවර්ධනය

තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 "න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කල යුතුව පවතින අතර සමාලෝචිත වර්ෂය තුලදී පවතින රාජ්‍ය රෝහල් 46 කට සූර්ය පැනල සවිකිරීම සඳහා සැලසුම්පත් හා පිරිවිතර සකස් කර දීම ලෙස එක් අරමුණක් හඳුනාගෙන තිබුණි. මෙම අරමුණෙහි ඉලක්කය ලෙස සූර්ය බලය උපයෝගි කරගෙන පුනර්ජනනීය බලශක්තිය නිපදවීම මඟින් තාපජනක විදුලි ඉල්ලුම අඩුකර ගැනීම දක්වා තිබුණි. දර්ශකයක් ලෙස පවත්නා රෝහල්වල සූර්ය පැනල සවිකිරීම යටතේ සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල ලිපි යොමුකල බව දන්වතත්, ලෝක බැංකු ආධාර යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මෙම ව්‍යාපෘතියෙහි අදාළ ඉදිකිරීම්වල ප්‍රගතියක් මේවන තෙක් නොවීය.

මේ හේතුවෙන් ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට අදාල තිරසාර සංවර්ධන අරමුණු සකස් කර ගැනීමට 2023 වසරේදීත් නොහැකි වී තිබුණි. එබැවින් කාර්යසාධන වාර්තාවෙහි දක්වා තිබූ ප්‍රගතිය විගණනයේදී පිළිගත නොහැක.

5.මානව සම්පත් කළමනාකරණය

5.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය

2023 දෙසැම්බර් 31 දිනට අනුමත, තත්‍ය, පුරප්පාඩු කාර්යය මණ්ඩලය පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තත්‍ය සේවක සංඛ්‍යාව		අතිරික්ත/ ඌනතාවය (අ)
		ස්ථිර	කොන්ත්‍රාත්	
ජ්‍යෙෂ්ඨ මට්ටම	126	95	0	31
තෘතීයක මට්ටම	24	5	0	19
ද්විතීයික මට්ටම	285	265	0	44/ (24)
ප්‍රාථමික මට්ටම	178	137	3	41
මුළු එකතුව	**613**	**502**	**3**	**135/(24)**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පුද්ගල පඩිනඩි වැය කාණ්ඩය වෙනුවෙන් රු.355,320,160 ක් වැයකර තිබුණි. ඒ අනුව ඒක පුද්ගල වියදම රු.703,604 ක් වී තිබුණි.

(ආ) ද්විතියික මට්ටමේ තනතුරුවල සංවර්ධන නිලධාරීන් 24 ක අතිරික්තයක් පවතින අතර ඒ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක (PS/GT/2020) (111 වෙළුම) හා 2022 ජනවාරි 03 දිනැති

ලිපියේ උපදෙස් පරිදි මු.රෙ.71 අනුමැතිය ලබා ගැනීමට මෙතෙක් කටයුතු කර නොතිබුණි.

(ඇ) එමෙන්ම පසුගිය වසර 05 ක කාර්යමණ්ඩලය 476 සිට 502 දක්වා එනම් සියයට 5 කින් වර්ධනය වී තිබියදී ප්‍රතිසංස්කරණ හා නව ඉදිකිරීම් ව්‍යාපෘති කාර්යසාධනය රු. මිලියන 4811.48 සිට රු.214.77 දක්වා එනම් සියයට 95 කින් අඩුවී තිබුණි.

එච්.ඒ.ඩී.චාන්දනී අබේසිංහ
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

පරිච්ඡේදය 04 — කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100%- 90%	75%- 89%	50%- 74%	50 % ට වඩා අඩු
සැලසුම් සටහන් නිර්මාණය			63.2 %	
සම්පූර්ණ කල ව්‍යාපෘති (ව්‍යාපෘති ගණන)		79%		
සම්පූර්ණ කල ව්‍යාපෘති වටිනාකම් අනුව	90%			

පරිච්ඡේදය 05- තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

	අරමුණු	ඉලක්ක	දර්ශකය	ප්‍රගතිය
01	පවතින රජයේ රෝහල් 46කට සූර්ය පැනල සවිකිරීම සඳහා සැලසුම්පත් හා පිරිවිතර (Specification) සකස් කර දීම -SDG 07	සූර්ය බලය උපයෝගීකරගෙන පුනර්ජනනීය බලශක්තිය නිපදවීම මගින් විදුලි ඉල්ලුම අඩුවීම.	පවතින රෝහල් සඳහා සූර්ය පැනල සවි කිරීම (1). සෞඛ්‍ය අමාත්‍යාංශයට අදාල ලිපි සකස් කර භාර දී ඇත.	100%

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවකයන් සංඛ්‍යාව	කොන්ත්‍රාත්/අනියම්	ඇබෑර්තු/ (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	126	95	0	31
තෘතියික	24	5	0	19
ද්විතියික	285	265	0	44/(24*)
ප්‍රාථමික	178	137	3	41
මුළු එකතුව	613	502	3	135/(24*)

❖ සංවර්ධන නිලධාරීන් 24 ක් අතිරික්තය. ඒ සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් ගේ අංක (PS/GT/2020 (III වෙලුම) හා 2022/01/03 දිනැති ලිපියේ උපදෙස් පරිදි මු.රෙ. 71 අනුමැති ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි සඳහන් කරන්න.

- ගොඩනැගිලි දෙපාර්තමේන්තුව රජයේ ගොඩනැගිලි ඉදිකිරීම් වෙනුවෙන් පුළුල් කාර්යය භාරයක් ඉටු කරන දෙපාර්තමේන්තුවක් වන අතර වර්තමානයේදී රජයේ ගොඩනැගිලි බොහොමයක නඩත්තු කටයුතු ද ඉටු කරනු ලබයි.
- එහිදී අවශ්‍ය වන තාක්ෂණික කාර්ය මණ්ඩලයේ හිඟකම හේතුවෙන් ව්‍යාපෘති කටයුතු කාර්යක්ෂමව කරගෙන යාමේදී බාධක මතුවේ.
- 2023/12/31 දිනට ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ අනුමත කාර්ය මණ්ඩලය වන 613 න් සේවයේ නියුක්තව ඇත්තේ 502 ක් පමණි.
- අත්‍යාවශ්‍ය තාක්ෂණික ගණයේ තනතුරු හෝ පුරවා ගැනීමට අවශ්‍ය අනුමැතිය හා අනුයුක්ත කිරීම් ලැබුනේ නම් ව්‍යාපෘති කටයුතු මීට වඩා කාර්යක්ෂමව ඉටුකිරීමේ හැකියාව පැවතුනි.

6.3 මානව සම්පත් කළමනාකරණය

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද ශේෂික සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම්/ලබා ගත් ඵල
				දේශීය	විදේශීය		
1	ISO 9001: 2015 ප්‍රමිතිය පිලිබඳ වැඩමුලුව සහ තත්ත්ව කමනාකරණ පද්ධති සැලසුම්	01	දින 02	17,692.29		දේශීය	
2	හරිත අනුකූලතා ප්‍රතිපාදන උසස් වෘත්තීය පුහුණු වැඩසටහන	01	දින 03	40,000.00		දේශීය	
3	රියදුරන් සඳහා විද්‍යාත්මක පිරිමැසුම්දායක සහ ආරක්ෂිත රිය පැදවීම් පිලිබඳ එක්දින වැඩමුළුව	04	දින 01	20,000.00		දේශීය	
4	රජයේ හා පෞද්ගලික අංශයේ කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටලු පිලිබඳ මාර්ගගත සම්මන්ත්‍රණය	01	දින 01	4,000.00		දේශීය	
5	තිරසර සංවර්ධනය පිලබඳ වැඩසටහන	28	දින 01	15,020.00		දේශීය	
6	Euro- codes මාර්ගගත සැලසුම් වැඩසටහන	01	දින 08	15,000.00		දේශීය	
7	ආර්ථික සංවර්ධනය, පරිපාලනය හා බලපෑම්කාරී වර්ධන උපාය මාර්ග පිලිබඳ පුහුණු වැඩසටහන	01	දින 04	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
8	අකුණු ගැටලු සම්බන්ධ නිර්මාණ පිලිබඳ CPD පාඨමාලාව	01	දින 04	25,600.00		දේශීය	
9	ඉංජිනේරුවන් සඳහා මූල්‍ය පුහුණුව CPD පාඨමාලාව	01	දින 08	12,200.00		දේශීය	
10	ඉදිකිරීම් කර්මාන්තයේ ගැටලු විසඳීම පිලිබඳ එක්දින පුහුණු වැඩසටහන	01	දින 01	12,000.00		දේශීය	
11	කාර්යාල උපකරණ පාලනය පිලිබඳ දෙදින වැඩමුළුව	01	දින 02	7,500.00		දේශීය	
12	ලේකම්වරුන්ගේ සහ ඉදිරි නිලධාරී කායී මණ්ඩල සඳහා දුරකතන පුහුණුව	01	දින 02	7,500.00		දේශීය	
13	ප්‍රවාහන කලමනාකරණය	01	දින 01	6,000.00		දේශීය	
14	පුද්ගලික ලිපිගොනුවක් පවත්වාගෙන යාම	02	දින 02	19,000.00		දේශීය	

අංකය	වැඩසටහන හෝ නම	පුහුණු කරන ලද අපේක්ෂිත සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (රු.)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	සටහන්
				දේශීය	විදේශීය		
15	ස්ථාන සමීක්ෂණය පිලිබඳ සම්මන්ත්‍රණය	01	දින 01	6,000.00		දේශීය	
16	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ එක්දින පාඨමාලාව	06	දින 01	15,000.00		දේශීය	
17	ගොඩනැගිලි සේවා ඉංජිනේරු M.Sc./ ඩිප්ලෝමා වැඩසටහන	01	වසර 02	200,000.00		දේශීය	
18	විගණන විමසුම සඳහා පිලිතුරු සැපයීම	01	දින 03	15,000.00		දේශීය	
19	ප්‍රසම්පාදන ක්‍රියාවලිය පිලිබඳ සහතික පත්‍ර පාඨමාලාව	01	දින 11	25,000.00		දේශීය	
20	ඵලදායීතා පූර්ණකරුවන්ගේ සංවර්ධනය සඳහා පස්දින පුහුණු පාඨමාලාව	01	දින 05	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
21	ආබාධ සහිත පුද්ගලයන්ගේ ප්‍රවේශතා විගණන පුහුණුව	03	දින 02	මුදල් නොගෙවන පාඨමාලාවකි		දේශීය	
22	ශ්‍රී ලංකා තාක්ෂණ සේවයේ 1 වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන තෙවන කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2020 (2022)	01	මාස 03	17,500.00		දේශීය	
23	ඒකාබද්ධ භාණ්ඩාගාර කළමනාකරණ තොරතුරු ව්‍යාපෘතිය	10	දින 04	72,000.00		දේශීය	
24	අමාත්‍ය මණ්ඩල සංදේශ පිළියෙල කිරීම	02	දින 01	12,000.00		දේශීය	
25	අභ්‍යන්තර විගණනය හා අභ්‍යන්තර පාලන ක්‍රම	01	දින 02	9,500.00		දේශීය	
26	විදුලි සවිකිරීම් පශ්චාත් උපාධි වැඩසටහන	01	වසර 01	125,000.00		දේශීය	
27	ප්‍රසම්පාදන කළමනාකරණ හා කොන්ත්‍රාත් පරිපාලනය පිලිබඳ ඩිප්ලෝමාව	01	වසර 01	100,000.00		දේශීය	
28	පැය 100 දෙමළ භාෂා පාඨමාලාව	19	දින 05	22,500.00		දේශීය	
29	පැය 150 දෙමළ භාෂා පාඨමාලාව	53	දින 14	63,000.00		දේශීය	
30	උස් ගොඩනැගිලි සඳහා ජලනල පද්ධති පාඨමාලාව	01	දින 02	13,000.00		දේශීය	
31	MTCP : වෘත්තීය ආරක්ෂාව සහ සෞඛ්‍ය රැකවරණය සහ ඉදිකිරීම් කර්මාන්ත කළමනාකරණය-මාර්ගගත	02	දින 05		මුදල් නොගෙවන පාඨමාලාවකි	විදේශීය	

07- පරිච්ඡේදය— අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
01	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1 .1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූලතා දක්වයි		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූලතා දක්වයි		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
I .5	විශේෂ අත්තිකාරම් මුදල්	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
02	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
03	**මූල්‍ය පාලනය සඳහා අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූලතා දක්වයි		
3.3	සෑම ගණුදෙණුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූලතා දක්වයි		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම.	අනුකූලතා දක්වයි		
04	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූලතා දක්වයි		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට(NBD) නියමිත දිනයට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
05	**විගණන විමසුම්**			
5. I	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
06	**අභ්‍යන්තර විගණනය**			
6. I	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම.	අනුකූලතා දක්වයි		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූලතා දක්වයි		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
07	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූලතා දක්වයි		
08	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූලතා දක්වයි		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූලතා දක්වයි		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූලතා දක්වයි		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූලතා දක්වයි		
9.2	වාහන ගර්හාත වී මාස 06 කට අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූලතා දක්වයි		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූලතා දක්වයි		
9.5	2016.12.29 දිනැති 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූලතා දක්වයි		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූලතා දක්වයි		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
10.2	සමාලෝචිත වර්ෂයේදී හො ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූලතා දක්වයි		
II.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූලතා දක්වයි		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම**			
12. I	සීමාවන්ට වලට අනුකූල වීම	අනුකූලතා දක්වයි		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම	අනුකූලතා දක්වයි		
13	**පොදු තැන්පත් ගිණුම**			
13. 1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූලතා දක්වයි		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූලතා දක්වයි		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූලතා දක්වයි		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූලතා දක්වයි		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූලතා දක්වයි		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූලතා දක්වයි		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සිමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූලතා දක්වයි		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරුතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූලතා දක්වයි		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූලතා දක්වයි		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූලතා දක්වයි		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාක්මක කර තිබීම	අනුකූලතා දක්වයි		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් පදනම් කරගෙන මානව සමපත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූලතා දක්වයි		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූලතා නොදක්වයි	පුහුණු වැය ශීර්ෂයේ ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම	

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාවය	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ /අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූලතා දක්වයි		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකිම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූලතා දක්වයි		
20	විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූලතා දක්වයි		

අවසානය